# කොළඹ ආසියාවේ දියුණුම නගරයක් කිරීමට අවශ්‍ය සැලසුම් සකසා අවසන්

## කොළඹ පුරපති අපේක්ෂක මිලින්ද මොරගොඩ

ශ්‍රී ලංකාවේ ප්‍රධාන වාණිජ කේන්ද්‍රස්ථානය වන කොළඹ නගරය දකුණු අසියාවේ වඩාත්ම සංවර්ධිත නගරය ලෙස නිර්මාණය කිරීමට අවශ්‍ය සැලසුම් මේ වනවිටත් සකස්කර ඇතැයි එක්සත් ජනතා නිදහස් සන්ධානයේ කොළඹ පුරපති අපේක්ෂක මිලින්ද මොරගොඩ මහතා ප්‍රකාශ කළේය.



හිටපු නගරාධිපතිවරයකු වූ එම්.එච්. මොහමඩ් මහතා පාලන බලය ලබාගත් අවස්ථාවේ කළ කතා ඇතුළත් පුවත්පත් ලිපි එකතුවක් මිලින්ද මොරගොඩ මහතා අවධානයට ලක් කළ අවස්ථාව

මිලින්ද මොරගොඩ මහතා මේ බව පැවැසුවේ නගර සභා මැතිවරණ ජය තහවුරු කිරීම අරමුණු කරගෙන ව්‍යාපාරික ප්‍රජාව සමග කොළඹ නිපොන් හෝටලයේ පැවැති විශේෂ සම්මන්ත්‍රණයකට සහභාගි වෙමිනි.

කොළඹ නගරයට ඇත්තේ සාඩම්බර ඉතිහාසයක්. නගරයේ ජීවත්වන අයට නගරයට ආදරය කරනවා. කුඩා පැල්පතේ සිට මහා මන්දිරයේ වෙසෙන පුද්ගලයා දක්වා ජීවත්වන්නේ නගරයේ ඇති ආර්ථිකය සමගයි. එක කොටසක් එක සමාජ පන්තියක් මේ ආර්ථිකයෙන් ඉවත්කරලා පවත්වත්වන්න බැහැ. මම දේශපාලනයේ සිටි පසුගිය කාලය තුළ කොළඹ දිස්ත්‍රික්කයේ තත්ත්වය දැක්කා. එක පැත්තකින් නගරය දියුණු කියන්න පුළුවන්. නමුත් අපි පසුවෙන්නේ තවත් ඉදිරියට යා හැකි අවස්ථාවක නගර සභා මැතිවරණය එක්ක. අද අපි නගරයේ ප්‍රශ්න ගැන අවධානය යොමු කර තිබෙනවා. නගරය කියන්නේ විශාල ආර්ථිකයක්. කවුරු බලයට පත්වුණත් නගරයේ අවස්ථා ඇතිවන්නේ පෞද්ගලික අංශය එක්ක ඒ බව අමතක කරන්න බැහැ.

රැකියා බිහිකරන්න පුළුවන් රජයට නොවෙයි, පෞද්ගලික අංශයට කියන එක අපි පිළිගන්න අවශ්‍යයි. ආණ්ඩුව කළ යුතු ප්‍රතිපත්ති සකස් කරලා, අවශ්‍ය පහසුකම් දෙන එකයි.

නගර සභාව කරන්නේ සේවයක්. නගයේ රැකියා කරන ව්‍යාපාර කරන හැම දෙනකුටම නගර සභාව තමන්ගේ සේවය ඉටු කර දෙනවා. රටක් දියුණු වනවිට අවශ්‍යතා වැඩි වෙනවා. මේ සේවය හරියට කරන්න පුළුවන් කාට ද? කියන එක අපි විමසා බලන්න අවශ්‍යයි.

මම නගරයේ ජනතාව හමුවන විට තරුණයන්ගේ රැකියා ප්‍රශ්නය උග්‍ර බව තේරුම් ගත්තා. මේ තරුණ පරපුරට රැකියා නැති නිසා විවිධ පැතිවලට යොමු වෙලා මත්ද්‍රව්‍ය, මත්පැන් ප්‍රශ්න විශාල එකක්. තරුණයන්ගේ විනය පිරිහෙන්න එය හේතුවක්. නගරයේ ආර්ථිකය දියුණු වනවිට විශාල රැකියා අවස්ථා ඇති වෙනවා. හෝටල් ඉදිවෙනවා. ව්‍යාපාරික ස්ථාන ඇති වෙනවා. සේවාදායක තැන් බිහි වෙනවා. නගරයේ තරුණයන් රැකියා විරහිතව ඉන්න නමුත් මේ අලුත් ව්‍යාපාර කර්මාන්තවලට රැකියාවට එන්නේ පිට පළාත් වලින්. නගරයේ තරුණයන් රස්සාවට ගන්නේ නැත්තේ ඇයි? කියලා මම මේ ව්‍යාපාර පවත්වාගෙන යන අයගෙන් විමසීමක් කළා. ඔවුන් කියන්නේ ඒ අයට නිසි පුහුණුවක් නැහැ, විනයක් නැහැ, කියන කාරණාවයි. ඇත්ත. රටක් දියුණු වෙන්න විනයක් අවශ්‍යයි. යම් කාර්යයක් වෙනුවෙන් පුහුණුවක් අවශ්‍යයි. අද නාගරික තරුණයන්ට විධිමත් රැකියා පුහුණුවක් අවශ්‍ය වෙලා තියෙනවා. නගරය පුරා වතු දහස් ගණනක් තියෙනවා. මේවායේ ඉන්න තරුණයන් දක්ෂ අයයි. යම් යම් අවාසනාවන්ත තත්ත්ව නිසා මේ පිරිස සමාජයෙන් කොන් වෙලා. නගරයේ රැකියාවලට මේ අය ගන්නේ නැහැ. මේ ස්වභාවය වෙනස් කරන්න අවශ්‍යයි. නගර සභාවට ඇති සම්පත්වලින් මේ වැනි අවදානයට යොමු නොවුණ පැති ගැන සොයා බලා විසඳුම් ලබා ගැනීම කළ යුතුයි.

ව්‍යාපාරික ප්‍රජාවගේ ආකල්ප වෙනස් කරන්න අවශ්‍යයි. නගරයේ තරුණයන් ගැන විශ්වාස කරලා ඔවුන්ට නගරයේ ඇති අවස්ථාවලින් කොටසක් දෙන්න පුළුවන්. ආර්ථික සමාජ වාතාවරණයක් ගොඩනැඟීම මගේ අරමුණක්. රජයේ රැකියා පමණක් බලාපොරොත්තු විය නොහැකියි. සමාජයේ මේ වෙනස ඇති කරන්න අපි හැම දෙනාම එකතු වෙන්න අවශ්‍යයි.

හිටපු නගරාධිපතිවරයකු වශයෙන් ක්‍රියා කළ එම්.එච්. මොහමඩ් මහත්මයා මෙ අවස්ථාවට සහභාගි වෙනවා. ඔහු නගරාධිපති වශයෙන් පාලන බලය ලබාගත් අවස්ථාවේ කළ කතා ඇතුළත් පුවත් පත් ලිපි එකතුවක් මට පෙන්වා සිටියා. එදා අවධාරණය කළ ප්‍රශ්න හා අද මහජනාතාව නඟන ප්‍රශ්න අතර වැඩි වෙනසක් නැහැ. එකම වෙනස මේවා ඉතා සංකීර්ණ හා විසඳා ගැනීමට අපහසු තරම් බරපතලවීම පමණයි.

එදා නගර සභාවට විසඳන්න තිබුණ ප්‍රශ්න අද ආණ්ඩුව, පළාත් සභාව සමග එකට එකතු වෙලා විසඳන මට්ටමට පත්වෙලා. පැල්පත් නිවාස එදත් ප්‍රශ්නයක්. එදා පැල්පත් නිවාස ගැටලු විසඳන්න උත්සාහ කළාට අද එය එදාට වඩා දැවෙන ප්‍රයශ්නයක්. එක ගෙදරක පවුල් දෙක තුන ඉන්න තත්ත්වයට පත්වෙලා. මේ පැල්පත් කඩා ඉවත් කරලා ප්‍රශ්න විසඳනවා කියන එක විහිළුවක්. මිනිසුන් පන්නලා පැල්පත් ඉවත් කරලා ප්‍රශ්න විසඳන්න බැහැ. අපි ප්‍රායෝගික වෙන්න අවශ්‍යයි. මේ පළාතේ කර්මාන්ත, ව්‍යාපාරවලට මේ සමාජයේ තරුණයන්ට අවස්ථාව දෙනවා, වගේම මේ ප්‍රදේශවල ජීවත් වන ජනතාවටත් කොළඹ නගරයේ හොඳ ජීවිතයක් ගතකරන්න අවකාශ සැලසිය යුතුයි.

මේක දේශපාලන පක්ෂ සාමාජිකත්වය බලලා විසඳන්න බැහැ. මිනිසුන්ගේ හිත් දිනාගෙන විශ්වාසය ඇති කරගෙන ක්‍රියාත්මක කළ යුතු වැඩ පිළිවෙළක්. එක්සත් ජනතා නිදහස් සන්ධාන රජය සමග එකතු වෙලා. අපි වැඩ පිළිවෙලක් ඉදිරිපත් කර තිබෙනවා. නගරය දියුණු කරන ඒ මගින් ජනතාවගේ ජීවිත සැපවත් කරන අංගසම්පූර්ණ වැඩ සටහනක්. කොළඹ නගර සභාව මේ වෙනුවෙන් අලුත් සැලසුම් අනුව වැඩ කරන්න සූදානම්. අපට අවශ්‍ය ව්‍යාපාරික ප්‍රජාව සාමාන්‍ය මහජනතාව වගේ හැම දෙනෙක්ම මේ නගරයේ කොටස්කරුවන් බවට පත් කිරීම. ඒක පහසු එකක් නොවෙයි. කාලයක් කැපවීමෙන් ක්‍රියා කළ යුතු සැලසුමක් එයට අවශ්‍යයි.

ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ මඟපෙන්වීම යටතේ අපට ඒක කරන්න පුළුවන්. අපට අවශ්‍ය මේ හැකියාව පෙන්වා මහජනතාවගේ විශ්වාසය දිනා ගෙන කොළඹ නගර සභාවේ පාලනය වෙනසක් ඇති කරන්නයි.

හිටපු අමාත්‍ය ආර්.ඒ.ඩී. සිරිසේන, හිටපු නගරාධිපතිවරයෙකු වූ එම්.එච්. මොහමඩ් යන මහත්වරු ද මෙහිදී කතා කළේය.